**ගොවීන්ගේ භාරකාර අරමුදල - 2019**
**-----------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

ගොවීන්ගේ භාරකාර අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

-----------------------------------------

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)ප්‍රමිත 01 හි 150 ඡේදය ප්‍රකාරව ආස්ථිත්වයේ නිත්‍ය පිහිටි තැන සහ නෛතික ස්වාභාවය, මෙහෙයුම්වල ස්වභාවය සහ එහි ප්‍රධාන කටයුතුවල විස්තරයක්, අස්ථිත්වයේ මෙහෙයුම් පාලනය කිරීමට අදාළ වන ව්‍යවස්ථාව පිළිබඳ යොමුවක් හෙළිදරව් කර නොතිබුණි. | ගොවීන්ගේ භාරකාර අරමුදල1994 මාර්තු මස 09 වන දින රජය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා හා අරමුදල වෙනුවෙන් එවකට කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්, එම අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම් කෘෂිකර්ම නිෂ්පාදන හා අලෙවි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්, ගොවිජන සේවා කොමසාරිස් හා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගෙන් සමන්විත මණ්ඩලයක් තැබූ භාරකාර ඔප්පුවක් මඟින් ස්ථාපනය කර ඇත.<br>විවිධ කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් සඳහා අත්තිකාරම්, ණය හා ප්‍රදාන ලබාදීම ගොවීන්ගේ භාරකාර අරමුදලේ ප්‍රධාන කාර්ය භාර්යය වේ.ගොවීන්ගේ භාරකාර අරමුදලේ අරමුදල් සපයා ගැනීම සඳහා ගොවිසෙත ලොතරැයියේ විකුණුම් ආදායමින් 10% ක ප්‍රතිශතයක් ගොවීන්ගේ භාරකාර අරමුදල වෙනුවෙන් ජාතික ලොතරැයි මණ්ඩලය මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.අරමුදලේ මූල්‍ය අවශ්‍යතාවය පරිදි විටින් විට ගොවීන්ගේ භාරකාර අරමුදල වෙත මහ භාණ්ඩාගාරය විසින් මුදල් නිදහස් කරනු ලැබේ. | ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බැංකු 05ක තැන්පත් කරන ලද රු.775,000,000ක ස්ථාවර තැන්පතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ රු.29,750,390ක පොලිය අඩුවෙන් ගණනය කිරීම හේතුවෙන් ලැබිය යුතු පොලී සහ පොලී අදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 තැන්පත් කර 2019 වර්ෂයේ දී කල්පිරී ඇති විගණන වාර්තාව මගින් පෙන්වා දී ඇති ස්ථාවර තැන්පතුවලට අදාළ පොලී මුදල පොලී ආදායමට ගැනීම මගහැරී ඇත. | සමාලෝචිත වර්ෂයට අදාළ ගනුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු බව. |

**1.5.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් සටහන් අනුව ගොවිසෙත ලොතරැයි ආදායම රු.4,181,413,741ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව එය රු.4,141,819,627ක් වූයෙන් රු.39,594,114ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය. | මහාභාණ්ඩාගාර පොත් අනුව ශේෂයේ අඩුවක් දක්නට ලැබෙනුයේ ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මහාභාණ්ඩාගාරය වෙත චෙක්පත් මගින් අදාළ මුදල් ප්‍රේෂණය කරන අතර එහිදී සිදුවී ඇති ප්‍රමාදයන් හේතුවෙනි. | මහාභාණ්ඩාගාරයේ ශේෂයේ හා ජාතික ලොතරැයි මණ්ඩලයේ ශේෂයේ වෙනසක් නොවිය යුතු බව. |

**1.5.4 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේ භාරකාර ඔප්පුවේ සඳහන් අරමුණු ඉටු කිරීම සඳහා මෙන්ම සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභසාධනය සඳහා අරමුදල ආරම්භ වුවද එම අරමුණු සඳහා අරමුදල් ප්‍රමාණවත් ලෙස නොයොදා සමාලෝචිත වර්ෂයේදී රු.755,001,919ක් ස්ථාවර තැම්පතුවලද රු.93,513,941ක් | ගොවීන්ගේ භාරකාර අරමුදලේ ඔප්පුවේ සඳහන් කාර්යන් වෙනුවෙන් අරමුදලේ මුදල් යෙදවීම සිදු කරන අතර වාර්ෂික ඇස්තමේන්තුව සඳහා ඉදිරිපත් වන ව්‍යාපෘති යෝජනා අනුව එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව විවිධ ආයතන හා පුද්ගලයින් සඳහා කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් හරහා ණය, ප්‍රදාන හා අත්තිකාරම් ලෙස මුදල් නිදහස් කරනු ලබයි. 2019 වර්ෂයේදී සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් දරන ලද | කෘෂි ශක්ති ණය වැඩසටහන වෙනුවෙන් ණය දීමට ප්‍රථම භාරකාර අරමුදලේ ඔප්පුවේ සඳහන් කාර්යයන් වෙනුවෙන් අරමුදලේ මුදල් යෙදවීම සිදුකළ යුතු බව. . |

භාණ්ඩාගාර බිල්පත්වලද ආයෝජනය කර පොලී ආදායම ලෙස රු.131,781,727ක් උපයා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේදී රු.826,396,000 ක පිරිවැයක් දරා ව්‍යාපෘති 78 ක් ආරම්භ කිරීමට ඇස්තමේන්තු කර තිබුණද, ඉන් පිරිවැය රු.197,400,112 ක් වූ ව්‍යාපෘති 32 ක් පමණක් ආරම්භ කර ඒ සඳහා සංවර්ධන වියදම් වශයෙන් රු.40,296,933 ක් පමණක් වැයකර තිබුණි.

වියදම අඩු වී ඇත්තේ බොහෝමයක් ව්‍යාපෘති සඳහා කෘෂි ශක්ති ණය වැඩසටහන හරහා විවිධ කෘෂිකාර්මික වැඩසටහන් වෙත ණය මුදල් ලබා දී ඇති නිසාය. ඒ තුළින්ද කෘෂිකාර්මික වශයෙන් සංවර්ධනයට දායක වී ඇත.

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

2002 වර්ෂයේ දී චක්‍රීය අරමුදල සහ කෘෂිකාර්මික භාර අරමුදල ඒකාබද්ධ කර ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේදී පවරා දුන් පහත දැක්වෙන වත්කම් ගිණුම් 02ක හා කොටස් ගිණුමේ ශේෂයන් සම්බන්ධව ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ණයගැති | 9,603,076 | ශේෂ සනාථ කිරීමේ ලිපි හා ණයගැති කාල විශ්ලේෂණය | මෙම ශේෂයන් අරමුදල වෙත පවරන ලද ශේෂයක් බැවින් ණයගැති කාල විශ්ලේෂණයක් සකස් කළ නොහැකි මෙම ශේෂය 2002 සිට ඒකාකාරීව පැවතියද ශේෂ සනාථ කිරීමට ආයතනයක් නොමැත. | වර්ෂ ගණනාවක සිට පවතින ශේෂ බැවින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | ගොවීන්ගේ තැන්පතු | 697,644 | විස්තරාත්මක තැන්පතු ලේඛනය | අරමුදල වෙත පවරන ලද ශේෂයක් බැවින් විස්තරාත්මක තැන්පතු ලේඛන අරමුදල සතුව නොමැත. ගිණුම් වාර්තාවල ශේෂයක් පමණක් පවතී. | -එම-. |
| (ඇ) | කොටස් ගිණුම | 591,965 | කොටස්කරුවන්ගේ නාම ලේඛනය | අරමුදල වෙත පවරන ලද ශේෂයක් බැවින් කොටස්කරුවන්ගේ නාම ලේඛනයක් අරමුදල සතුව නොමැත. ගිණුම් වාර්තාවල ශේෂයක් පමණක් පවතී. | -එම- |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට පැවති රු.26,035,319ක්වූ ණයගැති ශේෂ අයකර ගැනීමකින් තොරව වර්ෂ 03 සිට වර්ෂ 18 දක්වා වූ කාලයක් මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා තිබුණි. | 2019 වර්ෂයේදී අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර එහි නිර්දේශය අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ගෙන කපා හරින ලදි. නමුත් මහාභාණ්ඩාගාරය විසින් මෙම ශේෂ කපා හැර නොහැකි බවට දන්වා එවා ඇති අතර එහි තීරණය අනුව මෙම ශේෂ ගිණුම්වාර්තා වලින් ඉවත් නොකරන ලදි. 2020 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මාර්ගයෙන් හෝ මෙම ශේෂය ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. | ඉදිරියේදී කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගත යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 59,348,755 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 70,160,142 ක් විය. ඒ අනුව අතිරික්තයෙහි රු.10,811,387 ක අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම අඩුවීමට පසුගිය වර්ෂයට සාපේක්ෂව සංවර්ධන වියදම්වල වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කාබනික රෙඩ්ලේඩි පැපොල් වගාව සඳහා මොරගොල්ලාගම ගොවි මහතෙකු වෙත හා රු. 1,000,000 ක මුදලක් ඇප සුරකුම් ලබා ගැනීමකින් තොරව හා ක්ෂේත්‍ර චාරිකා වාර්තාවල ප්‍රගතියක් නොමැති බව වාර්තා කර තිබියදීත් 2015 හා 2016 වර්ෂයන් වලදි නිදහස් කර තිබුණි. 2019 දෙසැම්බර් මස වන විටත් ණය වාරික අය කර ගැනීමට අරමුදල | මෙම ව්‍යාපෘතියට ලබා ගත් ණය මුදල ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් ගොවිජන විනිශ්වය සභාව වෙත යොමු කරන ලද අතර එහිදී ණය මුදල් ගෙවීම සඳහා මස 12ක කාලසීමාවක් ලබා දෙන ලදී. එහෙත් මේ දක්වා වාරික ගෙවා අවසන් කර නොමැති බැවින් අධිකරණ ක්‍රියාමාර්ග ලබා ගැනීම සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ඉල්ලා ඇත | ණය වාරික අය කර ගැනීමට පියවරගත යුතු බව. |

| | | |
|---|---|---|
| අපොහොසත් වී තිබුණු අතර ගොවි බැංකුව විසින් රඳවා ගෙන තිබුණු 150,000 තැම්පතුව පමණක් අරමුදල වෙත ගෙන්වා ගෙන තිබුණි. | | |
| (ආ) අර්තාපල් බෝග වගාව සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටි වලපන ග්‍රාමයේ ව්‍යාපෘතියක් වෙනුවෙන් මාස 24 ක් ඇතුළත පියවීමේ පොරොන්දුව මත 2017 වර්ෂයේදී රු.1,000,000ක මුදලක් අනුමත කර ඉන් රු.500,000ක මුදලක් අදාළ ව්‍යාපෘති හිමියා වෙත නිදහස් කර තිබුණි. ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ කාර්යසාධන වාර්තාව මගින් මෙම ව්‍යාපෘති කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කර නොමැති බව දක්වා තිබීම හේතුවෙන් ඉතිරි මුදල නිදහස් කර නොතිබුණි. එසේ වුවද ලබාදුන් රු.500,000ක ණය මුදල හා පොලිය අයකර ගැනීමට අරමුදල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ව්‍යාපෘතිය සඳහා රු.1,000,000 ක මුදලක් අනුමත කරන ලද අතර මූලික වාරිකය ලෙස රු. 500,000 ක මුදලක් ලබා දෙන ලදී. ලබා දුන් වාරික මුදලින් ප්‍රමාණවත් වැඩ කොටසක් නිම කර නොතිබුණු නිසා දෙවන වාරික මුදල ලබා නොදෙන ලදී. ණය ගෙවීමේ කාලය මේ වන විට ඉක්ම ගොස් ඇති නිසා ගොවිජන විනිශ්චය සභාව වෙත යොමු කර ඇති අතර ඉදිරියේ දී අවසාන තීරණයකට එළඹීමට නියමිතය | ණය වාරික අය කර ගැනීමට හෝ නීතිමය පියවර ගැනීමට කටයුතු කළයුතු බව. |
| (ඇ) පොළොන්නරුව දිස්ත්‍රික්කය පුරා විහිදී ඇති කුඹුරු අක්කර 3000ක් Global Gap සහතිකකරණ ක්‍රමවේදයට අනුව 2018/2019 වගා කිරීම, ජාත්‍යන්තර ප්‍රමිතකරණය ක්‍රමවේද පිළිබඳ ගොවි ජනතාව දැනුවත් කිරීමේ හා පරිසර හිතකාමී තිරසර කෘෂිකාර්මික ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් ආර්ථික වාසි අත්පත් කර ගැනීම අරමුණු කර ගෙන පිහිට වූ රන් ගෙවිලිය සමාජ ව්‍යවසාය පොදු සමාගමට වසරක කාලයකින් ගෙවීමේ පදනම මත රුපියල් මිලියන 5.9 ක පොළී රහිත ණයක් ලබා දී තිබුණි. ව්‍යාපෘති කාල රාමුව අනුව 2019 මාර්තු මස වන විට ගෙවිලියන් ගේ වී නිෂ්පාදනය වෙනුවෙන් GAP | මේ සම්බන්ධයෙන් විශේෂිත කණ්ඩායමක් යොදවා ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත්කරමි. | කඩිනම් පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| (Good Agriculture Practice) සහතිකය ලබා ගැනීමට අපේක්ෂා කළද 2020 ජුනි වන විටත් එකදු ගෙවිලියක් හෝ අපේක්ෂිත මට්ටමට ළඟා වී නොතිබුණු අතර අරමුදල ලබා දුන් ණය මුදලද මෙතෙක් අය වී නොතිබුණි. | | |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථිර කාර්ය මණ්ඩලයක් නොමැතිවීම හේතුවෙන් ණය අයකර ගැනීමේ ප්‍රගතිය පහළ මට්ටමක වීම, නොපියවූ අත්තිකාරම් පැවතියදී නැවත නැවතත් අත්තිකාරම් ලබා දීම, ණය අයකර ගැනීමේ කාල ප්‍රමාදය, අය නොවන ණය කපා හැරීමට ලක් කිරීම ආදිය හේතුවෙන් අරමුදලේ මූල්‍ය කළමනාකරණය සතුටුදායක මට්ටමක නොපැවතුණි. | මෙම තත්ත්වය පිළිගනිමි. වරින් වර අමාත්‍ය මණ්ඩල මාරුවීම මත පනතේ කටයුතු මේ වන විටත් අවසන් කර ගැනීමට නොහැකි වී ඇත. පනත සම්මත වූ පසුව ස්ථිර කාර්ය මණ්ඩලයක් පත් කර විධිමත් බඳවා ගැනීමේ පරිපාටි සකස් කර ඉදිරි කටයුතු කිරීමට සැලසුම් සකස් කර ඇත. | ස්ථිර කාර්ය මණ්ඩලයක් පත්කරගත යුතු වේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 (ආ) ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ගොවීන්ගේ භාරකාර අරමුදලේ ඇස්තමේන්තුව සකස් කිරීම සඳහා වාර්ෂිකව කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ඇතුළු ආයතනවලින් ව්‍යාපෘති යෝජනා කැඳවා ඒ අතරින් තෝරා ගන්නා ව්‍යාපෘති යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන වර්ෂය පුරාවටම ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන බැවින් වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මක් සකස් කරනු නොලැබීය. | වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු බව. |